"තිරසාර සංවර්ධනයට සමුපකාරය"
"நிலையான அபிவிருத்திக்கு கூட்டுறவு"
"Co-operative for Sustainble Development"
# ඌව පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கூட்டுறவு அபிவிருத்தி திணைக்களம்
DEPARTMENT OF CO-OPERATIVE DEVELOPMENT- UVA PROVINCE
අංක 199, කැප්පෙටිපොල පාර, බදුල්ල.இல 199, கெப்பெட்டிபொல வீதி, பதுளை. NO -199,KEPPETIPOLA ROAD, BADULLA

මගේ අංකය / எனது இல / My No: 6/1/ශ්/7

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2025.09.12

01. නාමල් බිස්නස් සොලූෂන්ස් පුද්ගලික සමාගම, නො 2-B-22-L, සභාපතිවත්ත, ගල්වැව, වාරියපොල
02. සෙනෝවා ග්ලෝබල් පුද්ගලික සමාගම, ඕස්ටේෂියා, නො 290 යූ, පන්නිපිටිය පාර තලවතුගොඩ
03. සී/ස ප්‍රයිම් ඉංජිනියරින් ලංකා පුද්ගලික සමාගම, නො 36, පළමු මහළ, නුගේගොඩ පාර, පැපිලියාන
04. සී/ස සොෆ්ට්වෙයාර් ඉන්ෆොසිස් පුද්ගලික සමාගම, අංක 15, වාලුකාරාම පාර, කොළඹ 03
05. ඩී.එම්.එස් සොෆ්ට්වෙයා ඉංජිනියරින් පුද්ගලික සමාගම, නො 380, කොස්වත්ත පාර, කලපළුවාව, රාජගිරිය
06. INFOSYS සිසිටම්ස් සොලූෂන්ස් පුද්ගලික සමාගම, නො 402, මුනිදාස, කුමාරතුංග මාවත, කුරාන, කටුනායක
07. සීලාන් ටෙක් ඉන්ෆොමේෂන් සිස්ටම් පුද්ගලික සමාගම, 156 බී, බිගොඩ, බෙම්මුල්ල, ගම්පහ
08. නැනෝසොෆ්ට් ග්ලෝබල් පුද්ගලික සමාගම, අංක 86, 2 වන මහල, කුරුණෑගල පාර, කුලියාපිටිය 60200
09. ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය, නො 455, ගාලුපාර, කොළඹ 03

<u>පරිගණක මෘදුකාංග සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීම</u>

ඌව පළාතේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සමුපකාර සමිති සඳහා පරිගණක මෘදුකාංග සැපයීම වෙනුවෙන් සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීම සඳහා 2025.06.04 දිනැති පුවත්පත් දැන්වීම මගින් අයදුම්පත් කැඳවන ලදී.

02. මෘදුකාංග සැපයුම්කාර ආයතන වෙතින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් දෙපාර්තමේන්තු තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් ඇගයීමට ලක් කරන ලද අතර සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා තිබූ සුදුසුකම් සහ කොන්දේසි ඔබ ආයතනය සපුරා ඇති බව තාක්ෂණ ඇගයීම් කමිටු විසින් නිර්දේශ කර ඇත.

03. ඒ අනුව 2025.09.11 දින සිට 2026.12.31 දින දක්වා ඌව පළාතේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සමුපකාර සමිති සඳහා අවශ්‍ය පරිගණක මෘදුකාංග සැපයීම සඳහා සැපයුම්කරුවෙකු වශයෙන් ඔබ ආයතනය සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති බව සතුටින් දැනුම් දෙන අතර ඒ බව දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි ප්‍රදර්ශනය කර ඇති බවද කාරුණිකව සඳහන් කරමි.

පළාත් කොමසාරිස් / மாகாண ஆணையாளர் / Provincil Commissioner 055-2229867
පළාත් සහකාර කොමසාරිස් / மாகாண உதவி ஆணையாளர் / Provincil Asst.Commissioner 055-2232157
කාර්යාලය / காரியாலயம் / Office 055-2222176
ෆැක්ස් / தொலை நகல் / Fax 055-2222176
විද්‍යුත් තැපෑල-மின்னஞ்சல்-e.mail :-uvacoop@gmail.com

04. එමෙන්ම පහතින් සඳහන් කර ඇති අංක 01 සිට 08 දක්වා ඇති කරුණු සමඟ සැපයුම්කාර සමාගම් වශයෙන් ඔබ එකඟ විය යුතු බවත් කාරුණිකව සඳහන් කරමි.

1) මෘදුකාංගය ස්ථාපිත කිරීමට පෙර දෙපාර්ශවයම ගිවිසුමකට එළඹිය යුතුය. (මිල සේවා කොන්දේසි, පුහුණු කිරීම්,පසු සේවා)
2) මෘදුකාංගයට අදාල මෘදු පිටපත් (soft copy) සහ සම්පූර්ණ අත්පොත් (user manual) ඌව පළාත් සමුපාකාර සංවර්ධන කොමසාරිස් විසින් ඉල්ලා සිටින විටක ඉදිරිපත් කිරීමට සැපයුම්කරුවන් එකග විය යුතුය.
3) මෙම තාක්ෂණික ඇගයීමේදී අනුමත මෘදුකාංගය/මෘදුකාංග පමණක් ගැනුම්කාර සමිති වෙත නිකුත් කල යුතුය.
4) යම් හෙයකින් ඔබ ආයතනයෙන් මෙම මෘදුකාංග මිලදී ගැනීමට තීරණය කලහොත් මාගේ අනුමැතිය ලද පසු පමණක් මෘදුකාංගය ස්ථාපිත ක්‍රියාත්මක කල යුතු අතර මාගේ පූර්ව එකගතාවයකින් තොරව එකී මෘදුකාංගය සංවර්ධනය කල (upgrade or update) පිටපත් ස්ථාපිත නොකල යුතුය.
5) මෘදුකාංගය ස්ථාපිත කරන සෑම අවස්ථාවකම සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සිදුකල පූර්වාසන්න විගණනයේ ශේෂ ඇතුලත් කල යුතුය.
6) මේ හා සමාන වෙනත් මෘදුකාංග ආයතන සමඟ ගිවිසුම් ඇති කර ගැනීම හෝ ඔබ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ කාර්යමණ්ඩලය එම ආයතන වල ධුර දැරීම සිදු නොකල යුතුය.
7) මා විසින් මෙහි දක්වා ඇති කොන්දේසි සහ පරිගණක මෘදුකාංග සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම අයදුම්පත් කැඳවීමේදී ඔබ වෙත නිකුත් කල ආකෘති පත්‍ර වල සඳහන් එකඟතා සහ කොන්දේසිද මීට අතිරේකව අදාල වන අතර සමුපකාර සමිති සහ සැපයුම්කාර ආයතන අතර ගිවිසුම් ඇති කර ගැනීමේදී එකී එකඟතා සහ කොන්දේසි ගිවිසුමට ඇතුලත් කර ගැනීමට සැපයුම්කාර සමාගම් වශයෙන් ඔබ එකඟ විය යුතුය.
8) මෘදුකාංග මිලදී ගැනීමේදී විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයකට යටත්ව සහ අවශ්‍යතාවය පරිදි තාක්ෂණික ඇගයීමකින් පසුව මෘදුකාංග මිලදී ගැනීම අදාල සමුපකාර සමිති විසින් සිදු කරනු ඇත.

ජේ.එස්.ඒ.පි ජයසිංහ,
සමුපකාර සංවර්ධන කොමසාරිස් හා
සමිති රෙජිස්ට්‍රාර් - ඌව පළාත